

සාධනීය දේශපාලන සංස්කෘතියක් උදෙසා මාර්තු 12 ප්‍රකාශය නමින් පැෆරල් සංවිධානය විසින් මහජන නියෝජිතයන් උදෙසා ඉදිරිපත් කරනු ලැබූ පොදු නිර්නායක ප්‍රතිපත්තිය එළිදැක්වීමේ උත්සවයට සහභාගි වූ අගමැති රනිල් වික්‍රමසිංහ සහ විපක්ෂ නායක නිමල් සිරිපාල ද සිල්වා යන මහත්වරු. ඡායාරූපය - සුජාතා ජයරත්න

පවතින මැතිවරණ ක්‍රමය වෙනස් කරමින් සාධනීය දේශපාලන සංස්කෘතියක් කරා යැමට අගමැතිවරයාගේ කිසිම කැමැත්තක් නැතැයි විපක්ෂ නායක නිමල් සිරිපාල ද සිල්වා මහතා ඊයේ (12 වැනිදා) චෝදනා කළේය.

තමන්ගේ කෙටි දේශපාලන වාසියක් තකා අගමැතිවරයා මෙලෙස ක්‍රියා කරන බවත් දේශපාලන ගුණ්ඩු ගසමින් නව මැතිවරණ ක්‍රමයක් ගෙන ඒමේ ක්‍රියාවට ආණ්ඩුව බාධා කරන බවත් හෙතෙම කියා සිටියේය.

පාර්ලිමේන්තුව ලබන අප්‍රේල් 25 විසුරුවන බව කියමින් අගමැතිවරයා විසින් සිදු කරන දේශපාලන පික්පොකට් ගැසීමට සහාය නොදක්වන බවත් ඒ වෙනුවට සාධනීය දේශපාලන සංස්කෘතියක් වෙනුවෙන් මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමට ශ්‍රීලනිපය සහයෝගය දෙන බවද විපක්ෂනායකවරයා මෙහිදී කීය.

සාධනීය දේශපාලන සංස්කෘතියක් උදෙසා මාර්තු 12 ප්‍රකාශය නමින් පැෆරල් සංවිධානය විසින් මහජන නියෝජිතයන් උදෙසා ඉදිරිපත් කරනු ලැබූ පොදු නිර්නායක ප්‍රතිපත්තිය එළිදැක්වීමේ උත්සවයට සහභාගිවෙමින් හෙතෙම මේ බව පැවසීය.

උත්සවය බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී ඊයේ (12 වැනිදා) පැවැත්විණි.